

වාර්ෂික කාර්ය සාධන වාර්තාව

வருடாந்த செயலாற்றுகை அறிக்கை

Annual Performance Report

2022

සමුපකාර සේවක කොමිෂන් සභාව

கூட்டுறவு ஊழியர் சேவை ஆணைக்குழு

Co-operative Employees Commission

2022 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව

සමුපකාර සේවක කොමිෂන් සභාව

වැය ශීර්ෂ අංකය : 302

අන්තර්ගතය		පිටු අංකය
01 පරිච්ඡේදය	- ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය	1-5
02 පරිච්ඡේදය	- ප්‍රගතිය හා ඉදිරි දැක්ම	6 -7
03 පරිච්ඡේදය	- වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය	8 -17
04 පරිච්ඡේදය	- කාර්ය සාධන දර්ශක	18
05 පරිච්ඡේදය	- තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය	18
06 පරිච්ඡේදය	- මානව සම්පත් පැතිකඩ	19-20
07 පරිච්ඡේදය	- අනුකූලතා වාර්තාව	21-26

පරිච්ඡේදය 01

ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

1.3 ප්‍රධාන කාර්යයන්

1.4 සංවිධාන සටහන

1.5 අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු/දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාල - නැත

1.6 අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/පළාත්සභාව යටතේ පවතිනආයතන/අරමුදල්-නැත

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු - නැත

අ) ව්‍යාපෘතියේ නම

ආ) දායක නියෝජිතායතනය

ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම - රු.මි.

ඈ) ව්‍යාපෘති කාල සීමාව

01 පරිච්ඡේදය

ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

1972 අංක 12 දරන සමුපකාර සේවක කොමිෂන් සභා පනතෙහි 4 වගන්තියේ සඳහන් විධිවිධාන වලට අනුව සමුපකාර විෂය භාර ඇමතිවරයා විසින් පත්කරනු ලබන සාමාජිකයන් තිදෙනෙකුගෙන් කොමිෂන් සභාව සමන්විත වේ. එම සාමාජිකයන් තිදෙනාගෙන් එක් අයකු කොමිෂන් සභාවේ සභාපති වශයෙන් පත් කරන අතර, එකී සාමාජිකයන් තිදෙනාම තම පත්වීමේ දින සිට අවුරුදු 03ක කාල සීමාවක් එකී ධූරයන් දැරිය යුතු වේ. එසේ වුව ද සාමාජිකයෙකුගේ ඉල්ලා අස් වීම, ඇමතිවරයා විසින් එකී ධූරයෙන් ඉවත් කිරීම, මිය යෑම වැනි කරුණු වල දී හිස් වූ පුරප්පාඩුවක් පිරවීමට තුන් අවුරුදු කාලයෙන් ඉතිරිව ඇති කාලයට වෙනත් සුදුසු අයකු පත් කිරීමට ඇමතිවරයාට හැකිවේ.

2022 වර්ෂයේ මෙම කොමිෂන් සභාවේ සභාපති ලෙස **ඩබ්.කේ.එම්.සරත් කීර්තිරත්න** මහතා කටයුතු කළ අතර, සෙසු සාමාජිකයන් ලෙස **සමන් කුමාර මුතුකුමාරණ** මහතා සහ **ජී.ඩබ්.ඩී.ටී.පෙරේරා** මෙය කටයුතු කරන ලදී.

1972 අංක 12 දරන සමුපකාර සේවක කොමිෂන් සභා පනතෙහි 9 (1) වගන්තිය ප්‍රකාරව මෙම කොමිෂන් සභාවේ ලේකම්වරයා ලෙස ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරියකු පත් කළ යුතුය. එකී ලේකම්වරයා මෙම දෙපාර්තමේන්තුවේ ගණන් දීමේ නිලධාරියා ද වේ.

2022 වර්ෂයේ කොමිෂන් සභාවේ ලේකම්වරිය ලෙස ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරිණියක වන **පවිත්‍රා ජයතිස්ස මහත්මිය** කටයුතු කරන ලදී.

1972 අංක 12 දරන සමුපකාර සේවක කොමිෂන් සභා පනතෙහි 9 (2) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයෙහි සෙසු නිලධාරීන් ඒකාබද්ධ සේවාවන්ගෙන් පත් කරනු ලැබේ.

1972 අංක 12 දරන සමුපකාර සේවක කොමිෂන් සභා පනතෙහි 12 වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ වියදම් මහා භාණ්ඩාගාර වාර්ෂික විසර්ජන පනත යටතේ වෙන් කරනු ලබන මුදල් වලින් සිදු කෙරේ. 2022 වර්ෂයේ වැය ශීර්ෂ 302 යටතේ විසර්ජන පනතින් මුදල් ප්‍රතිපාදන වෙන් කර තිබුණි.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

තෘප්තිමත් සමුපකාරික මානව සම්පතක් නිර්මාණය කිරීම

මෙහෙවර

සමුපකාර ව්‍යාපාරයේ තිරසාර පැවැත්ම උදෙසා එම ක්ෂේත්‍රයෙහි මානව සම්පතෙහි අභිවෘද්ධිය පිණිස අවශ්‍ය ප්‍රතිපත්ති සකස් කිරීම

අරමුණු

සමුපකාර මානව සම්පතෙහි අභිවෘද්ධිය සම්බන්ධයෙන් වන්නා වූ ප්‍රධාන අරමුණු පහත පරිදි වේ.

i. සමුපකාර ක්ෂේත්‍රයේ මානව සම්පත් කළමනාකරණය සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති නිර්මාණය කිරීම.
ii. සේවා සුරක්ෂිතභාවය සඳහා නෛතික විධිවිධාන පැනවීම.
iii. සමුපකාර ක්ෂේත්‍රයේ කාර්මික ආරවුල් විසඳීම හා උපදේශන සේවා සැපයීම.
iv. සේවක අභිප්‍රේරණයට අවශ්‍ය ක්‍රියාවලින් නිර්මාණය හා මගපෙන්වීම ලබා දීම.

1.3 ප්‍රධාන කාර්යයන්

i. සමුපකාර සමිතිවලට සේවකයින් බඳවා ගැනීමේ දී, උසස් කිරීමේදී සහ ඔවුන්ට හිමි පාරිතෝෂික දීමනා ලබා දීමේදී අනුගමනය කළ යුතු ප්‍රතිපත්ති නිශ්චය කිරීම.

ii. සමුපකාර සමිතිවල තනතුරුවලට පත්කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් තීරණය කිරීම හා එවැනි තනතුරුවලට අදාළ වැටුප් පරිමාණයන් නියම කිරීම.

iii. සේවක ආරවුල් විසඳීම, අභියාචනා විභාග කිරීම සහ නියෝග ක්‍රියාත්මක කිරීම පැහැර හරින සමුපකාර සමිතිවලට එරෙහිව නීතීමය පියවර ගැනීම.

iv. කොමිෂන් සභාවට ඉදිරිපත් කෙරෙන අභියාචනා සම්බන්ධයෙන් අවශ්‍ය පරීක්ෂණ පැවැත්වීම.

v. ස්වකීය සේවකයින් සම්බන්ධයෙන් වූ විනයානුකූල ක්‍රියා මාර්ගයන්හිදී සමුපකාර සමිති විසින් අනුගමනය කල යුතු ක්‍රියාපටිපාටි තීරණය කිරීම.

vi. මානව සම්පත් සංවර්ධනය කිරීමේ සාකච්ඡා, සම්මන්ත්‍රණ හා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

1.4 සංවිධාන සටහන


ලේකම්
ගණකාධිකාරි
නීති නිලධාරි
පරිපාලන නිලධාරි
ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරි
සංවර්ධන නිලධාරි
කළමනාකරණ සේවා නිලධාරි (සමිති)
කළමනාකරණ සේවා නිලධාරි (පාලන)
කළමනාකරණ සේවා නිලධාරි (ගිණුම්)
කාර්යාල කාර්ය සහයක
රියදුරු

1.5 අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු/දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාල - නැත

1.6 අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/පළාත් සභාව යටතේ පවතින ආයතන/අරමුදල් - නැත

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු - නැත

02 පරිච්ඡේදය

ප්‍රගතිය හා ඉදිරි දැක්ම

ප්‍රගතිය

- 2022 වර්ෂයේ දී සේවක අභියාචනා 22ක් විභාග කර අවසන් තීරණ ලබා දී ඇත.

- සමුපකාර සමිතිවලින් උපදෙස් විමසා කර තිබූ ඉල්ලීම් 52ක් සඳහා අවශ්‍ය උපදෙස් ලබා දී ඇත.

- සමුපකාර සමිතිවලට සේවකයන් බඳවා ගැනීමේ දී කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා යොමු කර තිබූ ඉල්ලීම් අනුව තනතුරු 56ක් සඳහා බඳවා ගැනීම සම්බන්ධයෙන් අවසන් තීරණ ලබා දී ඇත.

- සමුපකාර සේවකයින්ට බලපාන කම්කරු නීතිය සහ සමුපකාර නීතිය පිළිබඳව සමුපකාර සමිති සේවකයින් දැනුවත් කිරීමේ වැඩමුළු 09ක් පවත්වා ඇත. මෙම වැඩමුළු සඳහා සේවකයින් 180 ක් සහභාගී වී ඇත.

- සේවක අයිතිවාසිකම් සහ සේවා සුරක්ෂිතතාවය තහවුරු කිරීම සඳහා 2022 වර්ෂයේ දී චක්‍රලේඛ 02ක් නිකුත් කර ඇත.

චක්‍රලේඛ අංකය	**දිනය**	**කාරණය**
2022/01	2022.02.21	සමුපකාර සේවකයින්ට රු.5000/-ක මාසික දීමනාවක් ලබා දීම.
2016/01 (v)	2022.08.09	කාර්යක්ෂමතා කඩඉම සඳහා ලබා දී තිබූ සහන කාලය දීර්ඝ කිරීම.

2023 වර්ෂය සඳහා ඉදිරි දැක්ම

i. 1972 අංක 12 දරන සමුපකාර සේවක කොමිෂන් සභා පනතේ සිදුවිය යුතු සංශෝධිත හඳුනා ගැනීම.

ii. සමුපකාර සමිතිවල සේවකයින්ට බලපාන සමුපකාර සේවක කොමිෂන් සභා නීතිය සහ ආකල්ප වර්ධනය ඇතුළු මානව සම්පත සංවර්ධනය සම්බන්ධව සේවකයින් දැනුවත් කිරීමේ එක් දින වැඩමුළු පැවැත්වීම.

දිනය: 2023.05.26

පවිත්‍රා ජයතිස්ස

ලේකම්

සමුපකාර සේවක කොමිෂන් සභාව

පවිත්‍රා ජයතිස්ස
ලේකම්
සමුපකාර සේවක කොමිෂන් සභාව
අංක 100/1/1 ලෝකෝර ආර්යා ණය අරමුදල් ගොඩනැගිලිල
ශ්‍රීමත් විත්තම්පනම් එ ගාඩිනර් මාවත,
කොළඹ 02.

03 පරිච්ඡේදය

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධනය

සමුපකාර සේවක කොමිෂන් සභාව — එසිස්-එස්

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය 2022 රු.		සටහන	කණ්ඩායම 2022 රු.	2021 රු.	
-	ආදායම් ලැබීම්		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	එසිස්-1
-	ජාත්‍යන්තර වෙළඳාම් මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	මුළු ආදායම් ලැබීම් (අ)		-	-	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		20,294,873	19,954,712	එසිස්-3
-	තැන්පතු		20,046	49,248	එසිස්-4
-	අත්තිකාරම් ගිණුම්		889,624	1,657,556	එසිස්-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		21,204,544	21,661,516	
-	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		21,204,544	21,661,516	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		343,423	453,967	
	ඉද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		20,861,121	21,207,549	
	අඩු කළා : වියදම්				
-	පුනරාවර්තන වියදම්		-	-	
12,900,000	වැටුප්, වෙතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	11,576,610	11,130,868	
7,300,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	6,582,176	6,702,562	එසිස්-2(ii)
100,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	73,239	155,034	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
20,300,000	මුළු පුනරාවර්තන වියදම් (ඊ)		18,232,025	17,988,464	
	මූලධන වියදම්				
-	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	-	-	
1,100,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	876,698	1,026,019	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	එසිස්-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	-	-	
300,000	හැකියා වර්ධනය	14	290,876	73,131	
-	වෙනත් මූලධන වියදම්	15	-	-	
1,400,000	මුළු මූලධන වියදම් (උ)		1,167,574	1,099,150	
	තැන්පතු ගෙවීම්		20,046	49,248	එසිස්-4
	අත්තිකාරම් ගෙවීම්		837,621	686,641	එසිස්-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (උෆ)		857,667	735,889	
	මුළු වියදම් එ = (ඊ+උ+උෆ)		20,257,266	19,823,503	
-	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		603,854	1,384,046	
	අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		603,854	1,384,046	එසිස්-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		603,854	1,384,046	එසිස්-3

1

3.2 මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

සමුපකාර සේවක කොමිෂන් සභාව
2022 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

එසිඒ-3

	සටහන	2022 රු.	2021 රු.
		තත්‍ය	
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	එසිඒ-6	25,263,288	24,544,370
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	එසිඒ-5/5(ඒ)	2,108,997	2,161,000
මුදල් හා මුදල් සමාන දෑ	එසිඒ-3	-	-
මුළු වත්කම්		**27,372,285**	**26,705,370**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		2,108,997	2,161,000
දේපළ පිරියත හා උපකරණ සංචිතය		25,263,288	24,544,370
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	**එසිඒ-5(බී)**		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	එසිඒ-4	-	-
අග්‍රිම ශේෂය	එසිඒ-3	-	-
මුළු වගකීම්		**27,372,285**	**26,705,370**
		-	-

පිටු අංක 7 සිට 26 දක්වා එසිඒ 1 සිට එසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 27 සිට 32 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මඟින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරී
නම : ඒ.එම්.පී.එම්.බී. අතපත්තු
තනතුර : ලේකම්, වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය
දිනය : 2023-02-24

ලේකම්
වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය

.....
ගණ්‍යන්දීමේ නිලධාරී
නම : පවිත්‍රා ජයතිස්ස
තනතුර : ලේකම්, සමුපකාර සේවක කොමිෂන් සභාව
දිනය : 2023.02.21

ලේකම්
සමුපකාර සේවක කොමිෂන් සභාව
අංක 100/1/1 ලෝගොට ආර්යා මාවත අරමුදල් ගොඩනැගිල්ල
ශ්‍රීමත් විජයබාහු ඒ ගාඩිනර් මාවත
කොළඹ 02.

.....
ගණකාධිකාරී
නම : ඩී.ඒ.ඒ එදිරිසිංහ
දිනය : 2023/02/21

ඩී. ඒ. ඒ. එදිරිසිංහ
ගණකාධිකාරී
සමුපකාර සේවක කොමිෂන් සභාව
අංක 100 1/1, ලෝගොට ආර්යා මාවත අරමුදල් ගොඩනැගිල්ල
ශ්‍රීමත් විජයබාහු ඒ ගාඩිනර් මාවත
කොළඹ 02.

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය
2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාල වර්ෂය සඳහා වන මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය



සමුපකාර සේවක කොමිෂන් සභාව ඒඑඒ-ඕ

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	තත්‍ය	
	2022 රු.	2021 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	-	-
අග්‍රිම ලැබීම්	20,294,873	19,954,712
අත්තිකාරම් අයකර ගැනීම්	-	-
තැන්පතු ලැබීම්	20,046	49,248
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**20,314,920**	**20,003,960**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	18,145,987	17,832,230
සහනාධාර සහ මාරුකිරීම්	73,239	155,034
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	-	-
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	343,423	453,967
අත්තිකාරම් ගෙවීම්	564,651	414,331
තැන්පතු ගෙවීම්	20,046	49,248
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**19,147,346**	**18,904,810**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**1,167,574**	**1,099,150**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	1,167,574	1,099,150
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**1,167,574**	**1,099,150**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(1,167,574)**	**(1,099,150)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය - අදාළ නොවේ

රු. ,000

ආදායම් ක්ෂේත්‍රය	ආදායම් ක්ෂේත්‍රයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
-	-	-	-	-	-

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු. ,000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	20,300	20,300	18,232	89.81%
ප්‍රාග්ධන	1,400	1,400	1,167	83.40%

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන - නැත

රු. ,000

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදන යේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
-	-	-	-	-	-	-

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. ,000

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2022 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2022 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැඟිලි හා ව්‍යුහයන්	රු.24,859,437.75	රු.24,859,434.75		
9152	යන්ත්‍රෝපකරණ				
9153	ඉඩම්				
9154	අස්පෘශ්‍ය වත්කම්	රු.403,850.00	රු.403,850.00		
9155	ජීව විද්‍යාත්මක වත්කම්				
9160	කෙරීගෙන යනවැඩ				
9180	බදු දෙන ලද වත්කම්				

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } TAC/C/CEC/FA/2022 මගේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2023 මැයි 16 දින

ලේකම්,

සමුපකාර සේවක කොමිෂන් සභාව

ශීර්ෂය - 302 - සමුපකාර සේවක කොමිෂන් සභාවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1. තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 302 සමුපකාර සේවක කොමිෂන් සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සමුපකාර සේවක කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට සමුපකාර සේවක කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි. ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම්, විගණකගේ වගකීම් යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධාන වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- මෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ මෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

2022 දෙසැම්බර් 13 දිනැති රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශ අංක 2022/05 හි 6 ඡේදයේ ඒසිඒ -(සි) හා 7.6 ඡේදයේ සඳහන් පරිදි මුදල් හා හරස් සටහන් යන දෙකම සැලකිල්ලට ගෙන මුදල් ප්‍රවාහ ප්‍රකාශ පිළියෙල කල යුතු වුවත් අත්තිකාරම් ගෙවීම් සහ අයකර ගැනීමේදී හරස් සටහන් පිළිබඳ අවධානය යොමු කර නොතිබීම් නිරීක්ෂණය විය.

(අ) මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී රු.272,970 ක් වූ අත්තිකාරම් අයකර ගැනීම් සැලකිල්ලට නොගැනීම හේතුවෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය එම ප්‍රමාණයෙන් අඩු වී තිබුණි.

(ආ) අත්තිකාරම් ගෙවීම් රු.837,621 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එය රු.564,651 ක් ලෙස රු.272,970 ක් අඩුවෙන් දක්වා තිබුණි.ඒ අනුව මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය රු.272,970 කින් අඩු වී තිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

302-01-01-1203 ආහාර පාන හා නිල ඇඳුම් වැය විෂය සඳහා රු.24,000 ක ප්‍රතිපාදනයක් ඉල්ලුම් කර තිබුණ ද මහා භාණ්ඩාගාරය විසින් අනුමත ඇස්තමේන්තුවේ රු.100,000ක ප්‍රතිපාදන මුදලක් අනුමත කර තිබුණි.

2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

2022 දෙසැම්බර් මස කාර්යාල පවත්වාගෙන යන ගොඩනැඟිල්ල වෙනුවෙන් රු.225,000 ක කුලියක් 2023 ජනවාරි මස ගෙවා නිබුණ ද එය බැරකම් ලේඛණයට ඇතුලත් කර නොතිබුණි. 302-01-01-1404 දරණ බදු කුලී සහ පළාත් පාලන ආයතන බදු වැය විෂයය යටතේ එම බැරකම පියවීම සඳහා ප්‍රතිපාදන කිසිවක් ඉතිරිව නොතිබුණි.

2.3 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කල යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායී ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, වාර්තාවේ 4:1 ඡේදයේ සඳහන් නිරීක්ෂණ අනුව එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 සැලැසුම් කිරීම

2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ 02/2020 ට අදාලව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව නිකුත් කළ මාර්ගෝපදේශ අංක 12 ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම තුල පහත තොරතුරු ඇතුලත් විය යුතු වුවත් කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කළ ක්‍රියාකාරී සැලැස්ම තුල පහත තොරතුරු ඇතුලත්ව නොතිබුණි.

- අදාළ වර්ෂයට යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය,අනුමත කාර්ය මණ්ඩලය සහ දැනට සේවයේ සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර

- අදාළ වර්ෂය සඳහා අනුමත අයවැය පදනම් කරගත් ප්‍රමුඛතා අනුව සකස් කළ ක්‍රියාකාරකම් සැලැස්ම,ක්‍රියාත්මක කාල රාමුව හා එම ක්‍රියාකාරකම්වල අපේක්ෂිත නිමවුම්/ප්‍රතිඵල සහ වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක්මුදල් අවශ්‍යතා සැලැස්ම

3.1.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

(අ) 2021 කාර්යසාධන වාර්තාවේ 2022 වර්ෂයේ ඉදිරි දැක්ම යටතේ සමූපකාර සේවකයින්ට බලපාන කම්කරු නීතිය හා සමූපකාර නීතිය පිළිබඳව සමූපකාර සේවකයින් දැනුවත් කිරීම සඳහා එක් දින වැඩමුළු 10 ක් පැවැත්වීම සහ එම වැඩමුළු සඳහා සමූපකාර සමිති සේවකයින් 400 ක් පමණ සහභාගි කරවා ගැනීමට අපේක්ෂා කර තිබුණ ද එලෙස ක්‍රියාකර නොතිබුණු අතර පුද්ගලික ලිපිගොනු සකස් කිරීම හා සේවක ආකල්ප වර්ධනය කිරීම සඳහා වැඩමුළු 09 ක් පවත්වා තිබු අතර ඒ සඳහා සමූපකාර සමිති සේවකයින් 180 ක් පමණක් සහභාගි කරවාගෙන තිබුණි.

(ආ) කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන අභියාචනා හා පැමිණිලි සම්බන්ධයෙන් අවශ්‍ය පරීක්ෂණ පැවැත්වීම කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යයක් වන අතර 2022 වර්ෂයේ ලද අභියාචනා 05 ක් තවදුරටත් විසඳීමට පැවතිණි.

4. යහපාලනය

4.1 අභ්‍යන්තර විගණනය

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීම සඳහා අභ්‍යන්තර විගණකවරයෙකු පත් කිරීමට කටයුතු කර නොතිබුණි.

- පනතේ 40.2 අනුව අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර නොමැති නම් පනත ක්‍රියාත්මක වන දින සිට වසර දෙකක් තුල පත් කිරීම සිදුකල යුතු වුවද ඒ අනුවද කටයුතු කර නොතිබුණි.

5. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2022 දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාවේ අනුමත සේවක සංඛ්‍යාව 23 ක් වූ අතර තත්‍ය සේවක සංඛ්‍යාව 15 ක් වූයෙන් පුරප්පාඩු 08 ක් පැවතුණි.
විස්තර පහත දැක්වේ.

	අනුමත සේවක සංඛ්‍යාව	තත්‍ය සේවක සංඛ්‍යාව	ඌණතාවය
ජ්‍යෙෂ්ඨ	03	03	-
තෘතියික	01	-	01
ද්විතියික	13	07	06
ප්‍රාථමික	06	05	01
	23	**15**	**8**

(ආ) කොමිෂන් සභාවේ අනුමත රියදුරු තනතුරු 03 ක් තිබූ අතර තත්‍ය කාර්ය මණ්ඩලය තුල රියදුරු තනතුරු 02 ක් පමණක් විය.ආයතනය සතුව වාහන 03 ක් පැවති අතර රියදුරන් දෙදෙනෙකු පමණක් සිටීම හේතුවෙන් එක් රියදුරෙකු වාහන 02 ක් භාවිතා කරමින් පැවතුණි.

බී.ජී.අයි.නිරංජා
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

04 පරිච්ඡේදය

කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශන	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම			
	100% - 90%	75% - 89%	50% - 74%	25%- 50%
සමුපකාර සේවකයින් දැනුවත් කිරීමේ වැඩමුළු	√			
සේවක පැමිණිලි, අභියාචනා සහ විභාග කිරීම	√			
සමිතිවලට උපදෙස් ලබා දීම	√			
බඳවා ගැනීම් සඳහා අනුමැතිය ලබා දීම	√			

05 පරිච්ඡේදය

තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න.
- නැත

ඉලක්කය/ අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0% - 49%	50% - 74%	75% - 100%
කාන්තා හා පුරුෂ දෙපාර්ශවයටම සියල්ලන් සඳහා පරිපූර්ණ හා සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම හා දිවිය පුරාම ඉගෙනුම් අවස්ථා ප්‍රවර්ධනය කිරීම.	දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වීමේ දී කාන්තා හා පුරුෂ දෙපාර්ශවයටම සහභාගී වීම සඳහා සමාන අවස්ථාවන් ලබා දීම.	කාන්තා සහභාගීත්ව ප්‍රතිශතය	-	-	100%

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න.

- 2022 වර්ෂය තුල පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩමුළු 09 සඳහා සහභාගී වූ 180 දෙනා අතරින් 111 දෙනෙක්ගේ කාන්තා සහභාගීත්වයක් වාර්තා වී තිබුණි.

06 පරිච්ඡේදය

මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු/(අතිර්ක්ත)**
ජ්‍යෙෂ්ඨ	03	03	-
තෘතීයික	01	00	01
ද්විතීයික	13	07	06
ප්‍රාථමික	06	05	01

6.2 ** ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.

ආයතනයේ කටයුතු පවත්වාගෙන යාමේදී මෙහෙයුම් මට්ටමේ සේවක හිඟය පැවතීම හේතුවෙන් රාජකාරි කටයුතු වල කාර්යක්ෂමතාවය සම්බන්ධයෙන් ගැටළු මතුවීම සහ යම් අවස්ථාවන්හි දී අපේක්ෂිත මට්ටමේ අරමුණු නියමිත වේලාවට සපුරාලීමට නොහැකි වීම.

6.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (රු.000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය)	නිමැවුම්/ලබා ගත් දැනුම *
			දේශීය	විදේශීය		
රාජ්‍ය ප්‍රසම්පාදනය සහ කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව	01	වසර 01 1/2	රු.84,000/-	-	දේශීය	
නිවාඩු හා නිවාඩු ලිපිකරුවන්ගේ කාර්යභාරය	01	දින 02	රු.7500/-	-	දේශීය	
ආකල්ප හා වෘත්තීය දැනුම ඉහළ නැංවීම	02	දින 02	රු.17,000/-	-	දේශීය	
සිවිල් විශ්‍රාම වැටුප් ගණනය කිරීම	01	දින 02	රු.7500/-	-	දේශීය	

සටහන:

* ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන් දායක වන්නේ කෙසේ ද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

කාර්යමණ්ඩලයේ විෂයානුබද්ධ දැනුම වර්ධනය වීම හේතුවෙන් වඩා ඵලදායී සේවයක් සැපයීම සහ සේවක අභිප්‍රේරණය ඇති වීම තුළින් ආයතනයේ කටයුතු වල කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම.

07 පරිච්ඡේදය

අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා හේතු පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය නිර්ණය කිරීමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාල නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාල නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාල නොවේ		
1.6	වෙනත්	අදාල නොවේ		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනව කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනව කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීනව කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙළ කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනව කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීනව කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීනව කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

2.9	භාණ්ඩ පාඩු ලේඛනය යාවත්කාලීනව කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීනව කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීනව කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍ර ලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරී ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අදාල නොවේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත්කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අදාල නොවේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අදාල නොවේ		

6.3	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අදාල නොවේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අදාල නොවේ		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍ර ලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අදාල නොවේ		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍ර ලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිළ දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳව තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍ර ලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍ර ලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳව තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍ර ලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍ර ලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල නොවේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අදාල නොවේ	ගර්හිත වූ වාහන නොමැති වීම	

9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්නකාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල නොවේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැළපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල වේ		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන් වලට අනුකූළ වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අදාල නොවේ		
15.2	රැස් කර තිබූ ආදායම් , තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අදාල නොවේ		
15.3	මු.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අදාල නොවේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූලවේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍ර ලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවාදෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවියට හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		

17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2008(1) දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍ර ලේඛ අනුව පුරවැසි /සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි /සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍ර ලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල නොවේ	ඉදිරියේදී සකස් කිරීමට නියමිතය.	
19.4	ඉහත චක්‍ර ලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		